අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය

# යුරෝපා ඉතිහාසය
## ஐரோப்பிய வரலாறு
## History of Europe



ප්‍රශ්න පත්‍රය I-II Question Paper I -II

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

| 25 B | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

**යුරෝපා ඉතිහාසය II (I කොටස)**
ஐரோப்பிய வரலாறு II (பகுதி)
History of Europe II (Part I)

පැය තුනයි
மணி மூன்று ஆகுது
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
தல் வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்
Additional Reading Time – 10 Minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

විභාග අංකය :....................................

උපදෙස්
- මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- **I කොටසෙහි** 1- 40 දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
- **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත.ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක්දැ’යි හඳුනාගෙන එහි **අංකය වරහන් තුළ** ලියන්න.

1. (1) තේම්ස් (2) එල්බ් (3) අසෙව් (4) නිපර් (5) රෝන් (.........)
2. (1) ආර්ගොස් (2) මෙගාරා (3) මිලේටස් (4) ගෝල් (5) කොරින්ත් (.........)
3. (1) ඇනෙක්සිමින්ස් (2) පෙරික්ලීස් (3) සොලොන් (4) ක්ලිස්තිනීස් (5) සිසරෝ (.........)
4. (1) රාජාණ්ඩුව (2) පූජක තන්ත්‍රය (3) කතිපයාධිපති (4) ප්‍රජාපීඩක (5) ප්‍රජාතන්ත්‍රවාදය (.........)
5. (1) ටැසිටස් (2) තුසිඩිඩීස් (3) ලිවී (4) හෙරඩෝටස් (5) සෙනෙකා (.........)
6. (1) බැල්බෝවා (2) වෝල්ටර් රූලේ (3) නාවික හෙන්රි (4) මාර්ක් විටේ (5) ලා සලේ (.........)
7. (1) ජෝන් ටෙට්සල් (2) ජෝන් හස් (3) ජෝන් කැල්වින් (4) ජෝන් වයික්ලිෆ් (5) ඉරාස්මස් (.........)
8. (1) අබේසියස් (2) මිරාබෝ (3) ජීන් පෝල් මරාත් (4) ඔලිවර් ක්‍රොම්වෙල් (5) ජෝර්ජ් ජැක් ඩැන්ටන් (.........)

9. (1) අයි-ලා-ෂැපෙල් (2) වෙරෝනා (3) ලයිබැක්
(4) ට්‍රොපෝව් (5) ජෙනා (.........)

10. (1) වුඩ්රෝ විල්සන් (2) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (3) ලොයිඩ් ජෝර්ජ්
(4) ක්ලෙමෙන් ෂෝ (5) විටෝරියෝ ඕලැන්ඩෝ (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත.ඒවා අතුරෙන් **එක් යුගලයක පද** එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය ඉදිරියේ ඇති වරහන තුළ** ලියන්න.

11. (1) සියුස් - ආකාශයට අධිපති දෙවියන්
(2) එරස් - සූර්ය දෙවියා
(3) ඩයනීසස් - වයින් පානයට අධිපති දෙවියා
(4) ඇෆ්‍රඩයිට් - ප්‍රේමයට අධිපති දෙවියා
(5) ප්‍රොසයිඩන් - සමුද්‍රයට අධිපති දෙවියා (.........)

12. (1) තෝමස් හොබ්ස් - කුමාරයා
(2) ඇරිස්ටෝටල් - දේශපාලනය
(3) ප්ලේටෝ - ජනරජය
(4) ශාන්ත ඇක්වයිනාස් - සුම්මා තියලොජිකා
(5) ශාන්ත ඔගස්ටින් - දෙවියන්ගේ නගරය (.........)

13. (1) ක්‍රිස්ටෝපර් කොලොම්බස් - කැරිබියන් දූපත්වලට ගොඩබැසීම
(2) නියුනෙස්ද බැල්බෝවා - පැනමා දේශ සන්ධියට පැමිණීම
(3) වස්කෝද ගාමා - අප්‍රිකාවේ දකුණු තුඩුවට යාත්‍රා කිරීම
(4) ෆර්නැන්ඩෝ කෝටෙස් - මෙක්සිකෝව ගවේශණය කිරීම
(5) ෆ්‍රැන්සිස්කෝ පිසරෝ - පීරූ දේශය යටත් කිරීම (.........)

14. (1) වින්ස්සර් - එංගලන්තය
(2) ටියුඩර් - එංගලන්තය
(3) ස්ටුවර්ට් - එංගලන්තය
(4) බ්‍රැගන්සා - එංගලන්තය
(5) හැනෝවර් - එංගලන්තය (.........)

15. (1) මෙඩිචි - ෆ්ලෝරන්ස්
(2) එස්තේ - ෆෙරාරා
(3) ස්ෆෝර්සා - මිලාන්
(4) ගොන්සාගා - මැන්ටුවා
(5) වැලෝයි - නේපල්ස් (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ.එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ.Y**තීරුව, **X** තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

| | X | Y |
|---|---|---|
| 16. | (I) හෝමර් | A - ඇන්ටිගන් |
| | (II) යුරිපිඩීස් | B - ද ක්ලවුඩ්ස් |
| | (III) සොෆොක්ලිස් | C - ට්‍රෝජන් විමෙන් |
| | (IV) ඇරිස්ටෝපෙනීස් | D - ඉලියඩ් හා ඔඩෙසි |
| | (V) හෙසියඩ් | E – වැඩ සහ දවස් |

(1) ABCDE (2) BEDCA (3) CADBE (4)DCABE (5) DCBEA (.........)

**X** **Y**

17. (I) රෆායෙල් සැන්සිඩ් — A- අවසාන විනිශ්චය
(II) මයිකල් ආන්ජිලෝ — B- ඇතැන්ස් හි පාසල
(III) බොට්ටිචෙල්ලි — C- වීනස්ගේ උපත
(IV) ලියනාඩෝ ඩාවින්චි — D- ආදම් සහ ඒව උද්‍යානයෙන් නෙරපීම
(V) මැසෙක්ෂියෝ — E- අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය

(1) ACEDB (2) BACED (3) CEABD (4) DBCAE (5) ECBAD (.........)

18. **X** **Y**

(I) ප්‍රංශ විප්ලවය — A- නිදහස,සමානාත්මතාව,සහෝදරත්වය
(II) උත්කෘෂ්ඨ විප්ලවය — B- බුද්ධිමතුන්ගේ විප්ලවය
(III) ඇමෙරිකානු විප්ලවය — C- රජු අභිබවා පාර්ලිමේන්තු බලය වර්ධනය කර ගැනීම
(IV) 1848 විප්ලවය — D- සාමය,ඉඩම් සහ ආහාර
(V) රුසියන් විප්ලවය — E- නියෝජනයක් නැතිනම් බදුත් නැත

(1) ACEBD (2) BDECA (3) CEDAB (4) EACDB (5)EBDAC (.........)

19. **X** **Y**

(I) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල — A- ජිනීවා
(II) ලෝක බැංකුව — B- වියානා
(III) ලෝක සෞඛ්‍ය සංවිධානය — C- පැරිස්
(IV) අන්තර් ජාතික න්‍යෂ්ටික බල අධිකාරිය — D- නිව්යෝර්ක්
(V) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය — E- වොෂින්ටං

(1) BACED (2) CABDE (3) DBCAE (4) DEABC (5) EACDB (.........)

20. **X** **Y**

(I) මිහායෙල් ගොර්බචොෆ් — A- සෝවියට් දේශයේ අවසාන පාලකයා
(II) මාර්ෂල් ටිටෝ — B- යුගෝස්ලෝවියානු ජනාධිපතිවරයා
(III) ක්ලෙමන් ඇට්ලි — C- "සොලිඩැරිටි" කම්කරු සමිතියේ නායකයා
(IV) කොන්රාඩ් ඇඩිනුවර් — D- II ලෝක යුද්ධයෙන් පසු එංගලන්ත ප්‍රථම අගමැති
(V) ලෙච් වලෙසා — E- ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ප්‍රථම චාන්සලර්වරයා

(1) ABDEC (2)BEACD (3) CEABD (4) DECAB (5) EDACB (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**. එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21. **ඉස්ලාම් දහම**
(1) ඉස්ලාම් දහම ඒක දේවවාදී ආගමකි.
(2) මහම්මත්නබි තුමා දේශනා කල ධර්මය ඉස්ලාම් ධර්මය නමින් හැඳින්වේ.
(3) මහම්මත්නබි තුමා ජෙරුසෙලමෙහිදී උපත ලැබීය
(4) ඉස්ලාම් දහම අඩංගු පූජනීය ග්‍රන්ථය ශුද්ධ වූ කුරාණය යි.
(5) ඉස්ලාම් ධර්මය වැළඳගත් අය මුස්ලිම්වරුන් නම් විය. (.........)

22. **පුනරුදය**
   (1) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ සෘජු ප්‍රතිඵලයකි.
   (2) ක්‍රි.ව. 1453 දී කොන්ස්තන්තිනෝපලය තුර්කීන් යටතට පත් වීම පුනරුදයට බලපෑ ප්‍රධාන හේතුවයි.
   (3) ඉතාලිය මුල් කරගෙන ආරම්භ විය.
   (4) යුරෝපයේ නූතනත්වයේ උපත සනිටුහන් කරයි.
   (5) පුනරුදය පසුව යුරෝපයේ වෙනත් රටවලට ද ව්‍යාප්ත විය. (.........)

23. **තිස් අවුරුදු යුද්ධය**
   (1) ජර්මනිය කේන්ද්‍ර කරගනිමින් ආරම්භ විය.
   (2) ශුද්ධ රෝම අධිරාජ්‍යයා ජයග්‍රහණය කරමින් අවසන් විය.
   (3) කතෝලිකයන් හා ප්‍රොතෙස්තන්ත්‍රවාදීන් අතර ඇති විය.
   (4) වෙස්ටර්ෆේලියා සාම ගිවිසුමෙන් ආගමික යුද්ධ අවසන් විය.
   (5) ක්‍රි.ව. 1648 දී ප්‍රංශය මැදිහත් වීමෙන් අවසන් විය. (.........)

24. **ජර්මනිය එක්සත් කිරීම**
   (1) 19 වන සියවස වන විට ජර්මනිය රාජ්‍ය 350කට පමණ බෙදී පැවතුණි.
   (2) වියානා ගිවිසුම මගින් ජර්මනිය රාජ්‍ය 39කින් යුත් සංයුක්තයක් ලෙස සංවිධානය කරන ලදි.
   (3) ජර්මනිය එක්සත් කිරීම ප්‍රෂියාවේ නායකත්වය යටතේ සිදු විය.
   (4) ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට මෙටර්නික් අනුග්‍රහය දැක්වීය.
   (5) එක්සත් ජර්මනිය ප්‍රථම අධිරාජ්‍යයා ලෙස පළමුවන විලියම් අභිෂේක ලැබීය. (.........)

25. **එක්සත් ජාතීන්ගේ සංගමය**
   (1) දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා පිහිටවනු ලැබීය.
   (2) ක්‍රි.ව. 1945 දී ආරම්භ විය.
   (3) ප්‍රධාන නිල ආයතන වලින් එකක් වූයේ මහා මණ්ඩලය යි.
   (4) ට්‍රිග්වි ලී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පළමු මහ ලේකම්වරයා විය.
   (5) ස්ථාවර මූලස්ථානය ජිනීවා හි පිහිටා ඇත. (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)**හා**(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
   (A) සහ (B) පමණක් නිවැරදි නම් ...................................................... 1 ද
   (A) සහ (C) පමණක් නිවැරදි නම් ...................................................... 2 ද
   (B) සහ (C) පමණක් නිවැරදි නම් ...................................................... 3 ද
   (C) සහ (D) පමණක් නිවැරදි නම් ...................................................... 4 ද
   වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

26. පහත දැක්වෙන කෘති අතරින් ඉස්ලාම් ශිෂ්ටාචාරයෙන් උරුම වූ දායාදයන් මොනවා ද?

   (A) අවිසින්නා
   (B) ඊනිඩ්
   (C) අරාබි නිසොල්ලාසය
   (D) ඉලෙක්ට්‍රා (.........)

27. පහත දැක්වෙන ජාතීන් අතරින් බටහිර රෝම අධිරාජ්‍යය ආක්‍රමණය කල ම්ලේච්ඡ ගෝත්‍ර මොනවාද?

(A) ලිඩියන්වරු
(B) ෆිනීෂියන්වරු
(C) වැන්ඩල්වරු
(D) විසිගොත්වරු (.........)

28. පහත දැක්වෙන දෑ අතුරෙන් ප්‍රති රෙපරමාදුවේ ප්‍රධාන අංග කවරේද?

(A) ජිනීවාහි කැල්වින්වාදී පල්ලිය
(B) ජේසු සංගමය
(C) අධර්ම මර්දනාධිකරණය
(D) ට්‍රෙන්ට් සම්මේලනය (.........)

29. පහත දැක්වෙන්නන් අතුරින් වියානා සම්මේලනයට සහභාගි වූ යුරෝපීය නායකයෝ කවරහුද?

(A) චාල්ස් ටැලිරැන්ඩ්
(B) කාසල්රි
(C) රිබන්ට්‍රොප්
(D) නෙකර් (.........)

30. දෙවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ/ ප්‍රකාශයක් නිවැරදි වේද?

(A) මිත්‍ර බලතුන් හා මධ්‍යම බලවතුන්ගේ පිල අතර ඇති විය.
(B) 1939 දී ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කිරීමෙන් ආරම්භ විය.
(C) ජපානය විසින් පර්ල් වරායට බෝම්බ දැමීමත් සමග ඇමෙරිකාව යුද්ධයට අවතීර්ණ විය.
(D) 1940 දී ජර්මනිය කොන්දේසි විරහිතව යටත් විය. (.........)

- අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයකම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත.එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට **නොගැළපේ**. එම **නොගැළපෙන** කරුණ තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. ජාතික රාජ්‍යයක ප්‍රධාන අංග
(1) නිශ්චිත දේශ සීමා (2) ශක්තිමත් ස්ථාවර හමුදාව (3) දුර්වල රාජාණ්ඩු
(4) ශක්තිමත් මධ්‍යම රජය (5) ජාතික එක්සත් බව (.........)

32. කාර්මික විප්ලව සමයේ පේෂ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන
(1) දුවන නඩාව (2) ස්පිනිං ජෙනිය (3) ජල රාමුව
(4) මියුල් යන්ත්‍රය (5) රෝලර් යන්ත්‍රය (.........)

33. ක්‍රි.ව. 1848 දී විප්ලව ඇති වූ රටවල්
(1) ජර්මනිය (2) රුසියාව (3) ඉතාලිය
(4) ප්‍රංශය (5) ඔස්ට්‍රියාව (.........)

34. ප්‍රංශ විප්ලවය හා සම්බන්ධ ප්‍රධාන සිදුවීම්
(1) ටෙනිස් පිටියේ දිවුරුම (2) බැස්ටීලයට පහර දීම (3) බොස්ටන් තේ සාදය
(4) ජාතික සභාව ක්‍රියාත්මක කිරීම (5) මධ්‍ය පාන්තිකයන් නායකත්වය ගැනීම (.........)

35. සෝවියට් දේශයේ පාලකයන්
(1) යූරි ගගාරින් (2) නිකිතා කෲෂෙෆ් (3) ඇලෙක්සි කොසිගින්
(4) ලියොනිඩ් බ්‍රෙෂ්නෙෆ් (5) ආන්ද්‍රපොෆ් (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1,2,3,4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාල අංකය වරහන තුළ ලියන්න.

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** | |
|---|---|---|---|
| 36 | ඇතැන්ස් හා ස්පාටාව අතර ඇති වූ යුද්ධ මාලාව පෙලපොනීසියානු යුද්ධය නමින් හඳුන්වනු ලැබේ. | දේශපාලනය පිළිබඳ ඇරිස්ටෝටල් ගේ වඩාත් ම ජනප්‍රිය කෘතිය වූයේ රිපබ්ලික් හෙවත් සමූහාණ්ඩුවයි. | (.........) |
| 37 | ක්‍රි.ව. 590 දී පමණ මහා ග්‍රෙගරි පාප් වහන්සේ යටතේ පාප් තනතුර බිහි විය. | කිතු දහමේ බලපෑමත් සමඟ යුරෝපා සමාජය විශාල පරිවර්තනයකට ලක් වූ අතර දේව වරම්වාදී අදහස් ප්‍රබල ලෙස ඉදිරිපත් විය. | (.........) |
| 38 | වාණිජවාදයේ ප්‍රධාන ලක්ෂණයක් නම් ආර්ථික කටයුතුවලට රජය මැදිහත් වීමයි. | දොළොස්වන සියවස වන විට වෙළෙඳ වාණිජ හා විද්වද් ආදී ක්ෂේත්‍ර වර්ධනය විය. | (.........) |
| 39 | 1789 සිට 1848 දක්වා වූ විප්ලවීය සමය තුළ චාර්ටිස්ට් ව්‍යාපාරය ප්‍රංශය තුළ වර්ධනය විය. | ලුවී නැපෝලියන් ක්‍රි.ව. 1848 දී ප්‍රංශ දෙවන සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයා බවට පත් විය. | (.........) |
| 40 | වී. අයි. ලෙනින් විසින් ආරම්භ කරන ලද නව ආර්ථික ප්‍රතිපත්තිය ජෝෂප් ස්ටාලින් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. | ජෝෂප් ස්ටාලින්ගේ විදේශ ප්‍රතිපත්තිය බටහිර ජාතීන් සමග සාමකාමී සහජීවනය අරමුණු කරගෙන පැවතුණි. | (.........) |

***

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

25 B | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

**යුරෝපා ඉතිහාසය II (II කොටස)**
**ஐரோப்பிய வரலாறு பகுதி**
**History of Europe II (Part II)**

යුරෝපා ඉතිහාසය - ග්‍රීක රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

**උපදෙස්**

- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- **II කොටස A, B** හා **C** ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

01.ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | අයර්ලන්තය | (ii) | මර්මරා මුහුද | (iii) | ඩෝවර් සමුද්‍ර සන්ධිය |
| (iv) | වෝල්ගා ගඟ | (v) | යුගෝස්ලෝවියාව | (vi) | ස්විට්සර්ලන්තය |
| (vii) | ක්‍රීට දූපත | (viii) | ශාන්ත පීටර්ස්බර්ග් | (ix) | ඩැන්සිග් |
| (x) | ලිවර්පූල් | (xi) | බොස්පරස් සමුද්‍ර සන්ධිය | (xii) | උතුරු මුහුද |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

## B කොටස

02. (i) පෞර රාජ්‍යයක සිට අධිරාජ්‍යයක් දක්වා රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 08 යි)

(ii) රෝම සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

03. ජාතික රාජ්‍යවල මූලික ලක්ෂණ පරීක්ෂාකර, එංගලන්තයේ හෝ ස්පාඤ්ඤයේ ජාතික රාජ්‍ය නැගීමේ ප්‍රධාන අවස්ථා විමර්ශනය කරන්න. (ලකුණු 16 යි)

04. "දේශපාලන හා ආර්ථික යන අංශ දෙකෙහිම සාධක හේතු කොට ගෙන ඇමෙරිකානු නිදහස් සටන ආරම්භ විය."

(i) ඇමෙරිකන් නිදහස් සටනේ නායකයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) එංගලන්ත ජනයා උතුරු ඇමෙරිකාවට සංක්‍රමණය වීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) උතුරු ඇමෙරිකාවේ පිහිට වූ ඉංග්‍රීසි ජනපද තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(iv) ඇමෙරිකානු නිදහස් සටන ඇති වීමට තුඩුදුන් ආර්ථික හා දේශපාලන සාධක විවේචනාත්මකව විමසන්න. (ලකුණු 04 යි)

(v) ඇමෙරිකානු නිදහස් සටන ඇමෙරිකාව සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපය සම්බන්ධයෙන්ද දැඩි බලපෑමක් ඇති කල ආකාරය ප්‍රතිඵල ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(I) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

(II) වැඩවසම් සමාජ ක්‍රමය

(III) 1688 උත්කෘෂ්ට විප්ලවය

(IV) ආගමික ප්‍රතිසංස්කරණ (ලකුණු 08 x 2 =16 බැගිනි)

## C කොටස

06. (i) නැපෝලියන් බොනපාට් ප්‍රංශයේ පාලකයා බවට පත් වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 06)

(ii) නැපෝලියන්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය ඇසුරෙන් ඔහුගේ කාර්ය සංසිද්ධිය අගය කරන්න. (ලකුණු10)

07. බාධක ජයගෙන ඉතාලිය එක්සත් කිරීමෙහි ලා මැසිනි, කැවුවර් හා ගැරිබෝල්ඩි යන නායකයන්ගේ කාර්ය භාරයන් පරීක්ෂා කරන්න. (ලකුණු 16)

08. **“ යුරෝපය බල කඳවුරුවලට බෙදී යාම පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමට මූල බීජය සපයන ලදි.”**

(I) පළමුවන ලෝක සංග්‍රාම සමයේ සිටි ජර්මන් අධිරාජ්‍යයා නම් කරන්න. (ලකුණු 01)

(II) පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමට බලපෑ ආසන්නත ම හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(III) යුරෝපය සතුරු කඳවුරු දෙකකට බෙදී ගිය ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04)

(Iv) පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමට තුඩු දුන් හේතු සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 09)

(09) පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩු දුන් සාධක

(ii) දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල

(iii) වී.අයි. ලෙනින්

(iv) තුෂ්ණී යුද්ධය (ලකුණු 08 x 2 =16 බැගිනි)

***

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

| 25 B | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

**යුරෝපා ඉතිහාසය II (II කොටස)**
**ஐரோப்பிய வரலாறு பகுதி**
**History of Europe II (Part II)**

ප්‍රශ්න අංකය
Question No

විභාග අංකය
Index no ……………………………………………………………



අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

**උපකාරක තක්සේරුව - පිළිතුරු පත්‍රය**
**உதவி மதிப்பீடு - விடைப்பத்திரம**
**Supportive Assessment - Answer sheet**

**සිංහල මාධ්‍යය**

# යුරෝපා ඉතිහාසය
## ஐரோப்பிய வரலாறு
## History of Europe



පිළිතුරු පත්‍රය I, II Answer Paper – I, II

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education (Adv. Level) Examination - 2026

| විෂය අංකය | 25 B | විෂය | යුරෝපා ඉතිහාසය |
|---|---|---|---|


## ලකුණු දීමේ පටිපාටිය
## I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **3** | 11 | **2** | 21 | **3** | 31 | **3** |
| 02 | **4** | 12 | **1** | 22 | **1** | 32 | **5** |
| 03 | **1** | 13 | **3** | 23 | **2** | 33 | **2** |
| 04 | **2** | 14 | **4** | 24 | **4** | 34 | **4** |
| 05 | **5** | 15 | **5** | 25 | **5** | 35 | **1** |
| 06 | **3** | 16 | 4 | 26 | **2** | 36 | **1** |
| 07 | **1** | 17 | **2** | 27 | **4** | 37 | **5** |
| 08 | **4** | 18 | 1 | 28 | **5** | 38 | **2** |
| 09 | **5** | 19 | 4 | 29 | **1** | 39 | **4** |
| 10 | **2** | 20 | 1 | 30 | **3** | 40 | **3** |

***විශේෂ උපදෙස් - එක් පිළිතුරකට ලකුණු 1 බැගින් - 1 x 40 =40***

ප්‍රශ්න අංකය
Question No

1



**B කොටස**

**02. (i) පෞර රාජ්‍යයක සිට අධිරාජ්‍යයක් දක්වා රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා සැකෙවින් විස්තර කරන්න.**

**රාජාණ්ඩුව (ක්‍රි. පූ. 753 - ක්‍රි.පූ. 510)**

- රෝමවරුන්ගේ සම්භවය සිදු වන්නේ ඉන්දු යුරෝපියානු භාෂාව කතා කරන ජන වර්ග සමූහයක එකතුවෙනි.
- රෝම නගරය ගොඩනගන ලද්දේ ලතින් භාෂාව කතා කරන ජනතාවයි. පසුව ඔවුන් රෝමවරු විය.
- පීතෘ මූලික සමාජ ක්‍රමයක් පැවති රෝම වරුන්ගේ මුල්ම පාලන ක්‍රමය වූයේ රාජාණ්ඩු පාලන ක්‍රමයයි.
- රාජාණ්ඩු පාලන ක්‍රමය ක්‍රි. පූ. 753 - ක්‍රි.පූ. 510 දක්වා ක්‍රියාත්මක විය.
- පරිපාලනයේදී රජුට විශාල බලතල ප්‍රමාණයක් හිමිවිය.
- රජු ප්‍රධාන පූජකයා, ප්‍රධාන විනිශ්චයකරු හා හමුදා නායකයා ද විය.
- සියලු රාජ්‍ය නිළධාරීන් රජු විසින් පත් කළ යුතුය.
- ව්‍යවස්ථාදායකය, විධායක, අධිකරණ යන අංශ වල විශාල බලතල ප්‍රමාණයක් රජු වටා ඒකරාශීව පැවතුන ද රජුට පරිපාලනයෙන් සහය වීම සඳහා වැඩිහිටි පුරුෂයන්ගෙන් සමන්විත පාලන මණ්ඩලයක් හෙවත් සෙනට් සභාවක් පැවතුණි.
- විවිධ ගෝත්‍ර නියෝජනය වන අකාරයට සෙනට් සභිකයන් පත් කරන ලදී.
- සෙනට් සභාව බොහෝදුරට රජුට උපදෙස් දෙන උපදේශක සභාවක් ලෙසින් ක්‍රියාත්මක විය.
- රජු වැදගත් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී සෙනට් සභාවෙන් අදහස් විමසිය යුතුය.
- සෙනට් සභාවට මහජන සභාවක් ද පැවතුණි. යුධ සේවයට සුදුසු සියලු පුරුෂයන් එහි සාමාජිකත්වය දැරීය.
- රජ කෙනෙකු පත් කිරීම ජනතාව විසින් අනුමත කළ යුතු වූ අතර ඔහු බලයෙන් පහ කිරීමට කිසිවෙකුට අයිතියක් නොතිබිණි.
- දේශපාලන හිමිකම උරුම වූයේ පැට්‍රිෂියන්වරු හෙවත් ඉඩම් හිමි පුහු පැලැන්තියටය.
- ක්‍රි. පූ. 534 දී එට්‍රස්කන් ඒකාධිපති ටාර්ක්වින් පාලකයා බවට පත් විය.
- ක්‍රි.පූ. 510 දී උඩගු ටාර්ක්වින් මරා රෝම ප්‍රභූවරු සමූහාණ්ඩු පාලනය ඇති කරන ලදී.

**සමූහාණ්ඩුව (ක්‍රි.පූ. 510 - ක්‍රි.පූ. 27 )**

- රදල අධිකාරී බලයක් පැවතීම.
- සියලු වරප්‍රසාද හිමිවූයේ පැට්‍රිෂියන් නම් ප්‍රභූ පන්තියටයි.
- සාමාන්‍ය ජනතාව ප්ලේබියන්වරු ලෙස හඳුන්වන ලදී.
- කලින් රජුට හිමිව තුබූ සිවිල් හා මිලිටරි බලය ප්‍රභූ ඡන්දයෙන් වාර්ෂිකව තෝරාපත් කරගත් "කොන්සාල්ස් " නම් නිලධාරීන් දෙදෙනාට පවරා තිබුණි.
- ඒකාධිපතිත්වය නැති කිරීම සඳහා එක් කොන්සාල්වරයෙකුට බලය හිමි විය.
- රෝම සමූහාණ්ඩුවේ වැදගත් ම මෙන්ම බලවත් ම දේශපාලන ආයතනය " සෙනට් සභාවයි ".
- පැට්‍රිෂියන්වරු 300 ක ගෙන් පමණ සමන්විත වූ මෙහි සාමාජිකයන් යාවජීව ලෙස පත් කරනු ලබන්නේ කොන්සාල්වරු විසිනි.
- සෙනට් සභාව සතු කාර්‍යයන් කිහිපයකි.
    - මූල්‍ය කටයුතු මෙහෙයවීම
    - විදේශ කටයුතු මෙහෙය වීම
    - සෙන්චූරියෙට් සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම.
    - නීති ක්‍රියාත්මක කිරීම.

- රෝම සමුහාණ්ඩුවේ තවත් වැදගත් දේශපාලන ආයතනයක් වූයේ " සෙන්චුරියෙට් සභාව ' හෙවත් මන්ත්‍රණ සභාවයි.
- මෙම සභාවට වැඩි ජනතා සහභාගීත්වයක් පැවත් අතර ජන්ද ක්‍රමය හේතු කොට ගෙන එය පැට්‍රිෂියන්වරු මෙහෙය වනු ලැබීය.
- සෙන්චුරියෙට් සභාව සතු බලතල කිහිපයකි.
  - කොන්සාල්වරුන් පත් කිරීම.
  - මන්ත්‍රණ සභාවට වාර්ෂිකව මහේස්ත්‍රාත්වරුන්, පරිපාලකයන් පත් කිරීම.
- මහේස්ත්‍රාත්වරුන්, පරිපාලකයින් වාර්ෂිකව තෝරා පත් කර ගත් අතර, ඔවුන් විධායක කටයුතුවලදී කොන්සාල්වරුන්ට සහය විය.
- හදිසි අවස්ථාවක් උදා වුවහොත් මාස හයක නිල කාලයකට යටත්ව ඒකාධිපති පාලකයෙකු පත් කිරීමේ බලය සෙනෙට් සභාවට පැවතුණි.
  උදා- දෙවන පියුනික් සටනේදී කාර්තේජ් ජෙනරාල්වරයෙකු වූ හැනිබල් පරාජය කිරීම සඳහා ෆේබියන් මැක්සිමස් පත් කිරීම.
- සමුහාණ්ඩු පාලනය තුළ පාලක පන්තිය හා සාමාන්‍ය ජනතාව අතර ප්‍රාධාන අයිතිවාසිකම් පිළිබඳ නිතරම ගැටුම් පැවතුනි.
- දිගු කලක් තිස්සේ පැවති අරගල වල ප්‍රතිඵලයක් ලෙසින් ප්ලේබියන්වරුන්ට මූලික අයිතිවාසිකම් කිහිපයක් දිනා ගත් හැකි විය.
  - රජයේ නිලතල දැරීම
  - පැට්‍රිෂියන් පවුල් සමඟ විවාහ සබඳතා පැවැත්වීම.
  - සෙනෙට් සභාව මගින් අවධනයට ලක් කරන අණපණත් සම්මත කිරීමට ඉඩ නොලැබෙන පරිදි ඒවා නිශේධ කිරීමට බලය තිබූ ට්‍රිබියුන්ස් නම් නිළධාරීන් තෝරාපත් කර ගැනීම.
- පැට්‍රිෂියන් හා ප්ලේබියන් ගැටුම නිරාකරණය කිරීමත් සමග රෝම සමුහාණ්ඩුව ප්‍රජාතාන්ත්‍රික මුහුණුවරක් ගන්නා ලදී
- අභ්‍යන්තර අර්බුද සමනය වීමත් සමග රෝම බලය විශාල ප්‍රදේශයක ව්‍යාප්ත විය.
- විශාල ප්‍රදේශයක් පාලනයට අපොහොසත්වීම නිසා රෝම සමුහාණ්ඩු පාලනය බිඳ වැටුණි.

**අධිරාජය පාලනය (ක්‍රි.පූ. 27- ක්‍රි.ව.476)**

- පියුනික් සටන් මාලාවෙන් අනතුරුව රෝමය මධ්‍යධරණී ප්‍රදේශ වල ප්‍රධානියා බවට පත් විය.
- ක්‍රි.පූ. 146 දි මැසිඩෝනියාවේ හා ග්‍රීසියේ පැවත් කැරලි මර්ධනය කොට රෝමයේ යටත් ප්‍රදේශ බවට පත්කර ගන්නා ලදී.
- මෙලෙස රෝමයේ බලය ව්‍යාප්තිය පදනම් කරගෙන සෙනට් සභාවේ අනුමැතියට යටත්ව හමුදා ප්‍රධානීහු කීප දෙනෙක් අනෙක් ප්‍රදේශ යටත් කර ගැනීමට සේනාව මෙහෙයවන ලදි.

| | |
|---|---|
| පොම්පේ | - සිරියාව හා මැද පෙරදිග |
| ක්‍රැසස් | - පාකියන්වරු |
| ජුලියස් සීසර් | - ප්‍රංශය, බෙල්ජියම හරහා එංගලන්තයට |

- අධිරාජ්‍යයේ ව්‍යාප්තිය පදනම් කරගෙන සෙනට් සභාවේ බලය හමුදා ප්‍රධානීන් සතු විය.
- මෙයින් ක්‍රැසස් සංග්‍රාම භූමියේ මියගිය අතර පොම්පෙගේ ක්‍රියාකලාපය හේතුවෙන් සීසර් අතින් ඔහු මරණයට පත් විය.
- සෙනට් සභාවේ බලය සීසර් ලබා ගැනීමත් සමග රෝම සමුහණ්ඩුවේ අවසානය සිදු විය.
- ක්‍රි.පූ. 27 දී සීසර්ගෙන් පසු බලයට පත් වූ ඔක්ටේවියන් හෙවත් ඔගස්ටස් සීසර් රෝමයේ පළමු අධිරාජ්‍යා ලෙස පෙන්වාදිය හැකිය.
- සෙනට් සභාව නාමික තත්වයට පත් වූ අතර අධිරාජ්‍යා වෙත සියලු බලතල කේන්ද්‍රගත විය.
- මහජන සභා පැවති නමුත් ඒවායේ බලතල ද අඩු කරනු ලැබීය.

**(ලකුණු 08)**

**(ii) රෝම සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.**

**රෝම ගෘහ නිර්මාණ**

- සැප පහසුකම් අතින් රෝම ගෘහ නිර්මාණ වඩා උසස් වේ.
- රෝමවරු සැපවත් ජීවිත ගත කිරීමට උනන්දු වූ අතර එය ගෘහ නිර්මාණ කෙරෙහි ද බලපාන ලදී.
- රෝම ගොඩනැගිලිවල දක්නට ලැබෙන නවාංග කිහිපයකි.
  - අර්ධ ගෝලාකාර ශිඛර
  - ආරුක්කු පැවතීම
  - ශාලාවන් පැවතීම
  - විදුරු කවුළු, සදළුතල, සෝල්දර වැනි අංගෝපාංග බහුලව යොදා තිබීම.
- රෝම විශිෂ්ට ගණයේ ගෘහ නිර්මාණ සඳහා උදාහරණ කිහිපයකි.
  - කොලෝසියම් ක්‍රීඩාගාරය
  - ඩයොක්ලිෂන් මාළිගය
  - ඔගස්ටස් සීසර් හා ලිවියා ආදීන්ගේ මන්දිර
  - කොන්ස්ටන්ටයින්ගේ බැසිලිකාව
  - නිම්සි රෝම දේවාලය
  - පොදු වැසිකිලි, නාන තටාක
- රෝම ගොඩනැගිලි ඉදිකිරීමේදී පොදුවේ දක්නට ලැබෙන ආකෘති කිහිපයකි.
  - ඇට්‍රියුම් - මැද මිදුලකට සමාන
  - අල්තාරය -දෙවියන් වන්දනාව සඳහා වූ ස්ථානය
  - පෙරිස්ටයිල් - දිගු ආලින්දයක ස්වරූපයෙන් ඉදි කිරීම.
  - ආලින්දය

**රෝම ආගම**

- බහුදේවවාදයක් පැවතීම.
- පිහිට පතා හෝ ආරක්ෂාව පතා යාතු කර්ම හෝ ඇදහිලි පැවැත්වීම.
- ඉතාම අවම වශයෙන් මානවාදි ස්වභාවයක් ගැනීම.
- දේශපාලන ස්වරූපයක් ගැනීම.
- සතුරන්ගෙන් රාජ්‍ය ආරක්ෂා කිරීම වෙනුවෙන් මිස මානව හැකියාවන් ශක්තිමත් කිරීමට ආගම මැදිහත් නොවීම.
- ස්වභාවධර්මයේ වස්තූන් හා තම අධිරාජ්‍යයන් දේවත්වයෙහි ලා සලකන ලදී.
  උදා- ඩයොක්ලිෂන්
- රෝම ආගම හා සංස්කෘතිය එකට බැදී පැවතුනි.
- රෝමවරු ආගමික උත්සව පැවැත්වූහ.
  - ලුපර්කේලියා- පෙබරවාරි 15
  - සැටුර්නේලියා - දෙසැම්බර් 17
- " සිකිලේටර් " නමින් මව් දෙවඟන සඳහා පුද පූජා පවත්වන ලදී.
- රෝමවරු ග්‍රීකයන් විසින් අදහන ලද දෙවිවරු වෙනත් නම්වලින් හඳුන්වා වැඳුම් පිදුම් කරන ලදී.

| | |
|---|---|
| ජුපිටර් | - අහසට අධිපති |
| මිනර්වා | - කලාවට, වෙළඳාමට අධිපති |
| මාර්ස් | - යුද්දයට අධිපති |
| සෙරස් | - සරුසාර අස්වැන්නට අධිපති |
| වීනස් | - ආලයට අධිපති |
| නෙප්චූන් | - මුහුදට අධිපති |

- පසුකාලීනව ක්‍රිස්තියානි දහම රෝමයේ රාජ්‍ය ආගම බවට පත් විය.

**සාහිත්‍ය**

- ග්‍රීක සාහිතය ඇසුරෙන් පෝෂණය වීම.
- ග්‍රීක සාහිත්‍ය තරම් දියුණු නොවිය.
- ප්‍රථම ලතින් කෘතිය ග්‍රීක මහා කාව්‍යයක් වූ ඔඩිසි ග්‍රන්ථයේ පරිවර්තනයකි.
- රෝමයේ පළමු ඉතිහාසය ලියැවුනේ ග්‍රීක භාෂාවෙනි.
- ප්‍රතිභා සම්පන්න ලේඛකයන් කිහිප දෙනෙකි.

| | |
|---|---|
| ප්ලෝටස් | - ග්‍රීක අභාසය ලත් කතෘවරු |
| ටෙරන්ස් | - ග්‍රීක අභාසය ලත් කතෘවරු |
| ජූලියස් සීසර් | -ගල්ලික යුද්ධය රචනා කිරීම. |
| ප්ලිනි | - නැචුරාලිස් හිස්ටෝරියා රචනා කිරීම. |
| ප්ලූටාක් | - ජනප්‍රිය ජීවිත කතා ලියූ ලේඛකයෙකි. |
| ටැසිටස් | - ඉතිහාසය විචාරාත්මකව රචනා කිරීම. |
| කැටලස් | - ලිරික් කාව්‍ය ( ගේය කාව්‍ය) රචනා කිරීම. |
| හොරස් | - දක්ෂතම කවියා. |
| ජුවෙනල් | - දක්ෂතම කවියා. |
| ප්ලෝටස් | - දක්ෂතම කවියා. |
| වර්ජිල් | - රිනිඩ් කෘතිය රචනා කිරීම, ග්‍රීක මහාකවි හෝමර්ට සම කරයි. |

**(ලකුණු 08)**

**03. ජාතික රාජ්‍යවල මූලික ලක්ෂණ පරීක්ෂාකර, එංගලන්තයේ හෝ ස්පාඤ්ඤයේ ජාතික රාජ්‍ය නැගීමේ ප්‍රධාන අවස්ථා විමර්ශනය කරන්න.**

නිශ්චිත දේශ සීමාවකින් සහ නිශ්චිත ජන සංඛ්‍යාවකින් සමන්විත වූ සමාන භාෂාවක් ව්‍යවහාර කරන පොදු වූ ජාතික අනන්‍යතාවකින් යුක්ත වූ දේශපාලන ඒකකය ජාතික රාජ්‍ය නමින් හැඳින්වේ.

**ජාතික රාජ්‍ය බිහි වීමේ පසුබිම**

- නැඟී ආ මධ්‍යම පන්තියේ ක්‍රියාකාරීත්වය
- මකියාවලි, ජීන් බොඩැන් යන දාර්ශනිකයන්ගේ මතවාද
- පුනරුදයේ බලපෑම්
- වාණිජවාදය
- ජාතිමාමක අදහස් ප්‍රචලිත වීම

**ජාතික රාජ්‍යවල පොදු ලක්ෂණ**

- නිශ්චිත භූගෝලීය දේශ සීමාවකින් යුක්ත වීම
- ස්වෛරී රාජාණ්ඩුව
- ප්‍රදේශීය නායකයන්ගේ බලය සීමා වීම
- පෞද්ගලික නිලකාර හමුදා අහෝසි කිරීම
- රජු ස්ථිර හමුදාවක් පවත්වාගෙන යාම
- ජාතික නීති පද්ධතියක් බිහි වීම
- ජාතික බදු ප්‍රතිපත්තිය
- වැටුප් ලබන නිලධාරී පන්තියක් බිහි වීම
- ප්‍රථමයෙන් ස්පාඤ්ඤය, එංගලන්තය, ප්‍රංශය මුල් කරගෙන ජාතික රාජ්‍ය බිහි වීම

**එංගලන්තය**

- යුරෝපයේ පැනනැඟි මුල් ම ජාතික රාජ්‍ය එංගලන්තය විය.
- නොමැන්ඩියේ පාලකයා වූ විලියම් 1066 දී එංගලන්තය ජයගෙන බෙදී පැවති ප්‍රදේශ වරින් වර එක්සත් කිරීම
- සැලිස්බරි ගිවිසුම මඟින් වැඩවසම් ප්‍රධානය රජුට පක්ෂපාත ව හා යටත් ව තබා ගැනීම
- 1154 දී රජ බවට පත් වූ දෙවෙනි හෙන්රි පොදු නීති පද්ධතියක් ආරම්භ කිරීම, රට පුරා ක්‍රියාත්මක සංචාරක විනිශ්චයකරුවන් සහ ජූරි ක්‍රමය හඳුන්වා දීම
- 1485 බලයට පත්වූ හත්වෙනි හෙන්රි රජු ටියුඩර් නමින් නව රාජ වංශයක් ආරම්භ කොට ප්‍රබල රාජාණ්ඩුවක් බිහි කිරීමට පියවර ගැනීම
- රදල බලය මෙල්ල කොට මධ්‍යම පාන්තිකයන්ගේ සහය ලබා ගැනීම
- ස්ටාර්චෙම්බර් උසාවිය පිහිටුවීම
- ක්‍රිස්තු සභාවේ බලය දුර්වල කිරීමට පියවර ගැනීම
- ශක්තිමත් නාවික හමුදාවක් ගොඩ නැඟීම
- 8 වෙනි හෙන්රි රජුගේ පාලන සමයේ පාර්ලිමේන්තුව ද සම්බන්ධ කරගෙන රෙපරමාදු ව්‍යාපාරය මෙහෙයවමින් එංගලන්තයේ සහ රෝමයේ ක්‍රිස්තු සභාව අතර තිබූ සබඳතා අවසන් කොට ඇංග්ලිකානු සභා සංවිධානය ආරම්භ කර රජු එංගලන්ත පල්ලි සංවිධානයේ නායකයා බවට පත් කිරීම
- 1688 උත්කෘට විප්ලවය අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
- අයිතිවාසිකම් ප්‍රකාශය මඟින් රජු / රැජිනිගේ බලය පාර්ලිමේන්තුවේ බලයට යටත් කොට, පාර්ලිමේන්තුවේ ආධිපත්‍යය යටතේ ප්‍රොතෙස්තානු රාජ්‍යයක් පිහිටුවීමත් සමග එංගලන්තයේ ජාතික රාජ්‍යය ගොඩ නැඟීම සම්පූර්ණත්වයට පත් විය.

**ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් ලෙස ගොඩනැඟීම**

- 1469 දී ඇරගන්හි ෆර්ඩිනන්ඩ් කුමාරයා සහ කැස්ටීල්හි ඉසබෙලා කුමරිය අතර ඇතිවූ විවාහය
- 1492 ග්‍රැනඩාවත් 1512 නවාරේ රාජ්‍යයත් ඈඳා ගැනීම
- දේශගවේෂණ මගින් බාහිර ප්‍රදේශ ස්පාඤ්ඤයට ඈඳාගෙන එහි ශක්තිය හා ශ්‍රේෂ්ඨත්වය වැඩි කිරීම
- නේපල්ස්, සිසිලි, සාර්ඩිනියා ප්‍රදේශ වල ස්පාඤ්ඤයේ ආධිපත්‍යය පිහිටුවීම
- ශුද්ධ රෝම අධිරාජයා සමඟ ඥාති සබඳතා ඇති කර ගැනීම
- ස්පාඤ්ඤය තුළ ප්‍රතිසංස්කරණ රාශියක් ඇති කිරීම
- වංශාධිපති බලය දුර්වල කිරීම හා මධ්‍යම පංතියේ සහායත්වය ලබා ගැනීම
- පොදු නීති පද්ධතියක් රට තුළ ක්‍රියාත්මක කිරීම
- ආගමික ප්‍රතිසංස්කරණ මගින් ජාතික හැඟීම ඇති කිරීම
- පළමුවන චාල්ස් රජුට ශුද්ධ රෝම අධිරාජ තනතුර ලැබීම
- ස්පාඤ්ඤය සතු යටත් විජිත වලින් යුක්ත අධිරාජ්‍යයක් ගොඩ නැඟීම
- ස්පාඤ්ඤය යුරෝපයේ ධනවත් ම රට බවට පත් කිරීම හා අභ්‍යන්තර ප්‍රතිසංස්කරණ ඇති කිරීම
- දෙවන පිලිප් රජු විවාහ සබඳතා ඇති කොට රාජ්‍යත්වය ස්ථාවර කරගැනීම
- වැඩවසම් ප්‍රධානය දුර්වල කිරීමට උත්සාහ ගැනීම

**(ලකුණු 16)**

**04. "දේශපාලන හා ආර්ථික යන අංශ දෙකෙහිම සාධක හේතු කොට ගෙන ඇමෙරිකානු නිදහස් සටන ආරම්භ විය."**

**(i) ඇමෙරිකන් නිදහස් සටනේ නායකයා නම් කරන්න.**

ජෝර්ජ් වොෂිංටන් **(ලකුණු 01)**

**(ii) එංගලන්ත ජනයා උතුරු ඇමෙරිකාවට සංක්‍රමණය වීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න.**

යුරෝපයේ ජාතික රාජ්‍ය බිහිවීම
ජාතික රාජ්‍යවල මධ්‍යම පන්තිය බලවත් විම
ජාතික රාජ්‍යවල පාලකයන් දේශගවේශණවලට අනුග්‍රහය දැක්වීම
වාණිජවාදී අදහස් ව්‍යාප්ත වීම
යුරෝපය තුළ ඇති වූ ආගමික ගැටුම්

**(ලකුණු 02)**

**(iii) උතුරු ඇමෙරිකාවේ පිහිට වූ ඉංග්‍රීසි ජනපද තුනක් නම් කරන්න.**

වර්ජීනියා ජෝර්ජියා නිව්යෝර්ක් උතුරු කැරොලිනා දකුණු කැරොලිනා
නිව් හැම්ප්ෂයර් මැසචුසෙට්ස් නිව් ජර්සි ... **(ලකුණු 03)**

**(iv) ඇමෙරිකානු නිදහස් සටන ඇති වීමට තුඩුදුන් ආර්ථික හා දේශපාලන සාධක විවේචනාත්මකව විමසන්න.**

- බ්‍රිතාන්‍ය වාණිජවාදී ප්‍රතිපත්තිය
- 1767 ටවුන්සෙන්ඩ් පනත
- බොස්ටන් තේ සාදය **(ලකුණු 04)**

**(v) ඇමෙරිකානු නිදහස් සටන ඇමෙරිකාව සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපය සම්බන්ධයෙන්ද දැඩි බලපෑමක් ඇති කල ආකාරය ප්‍රතිඵල ඇසුරෙන් පැහැදිලි කරන්න.**

- ඇමෙරිකා එක්සත් ජනපදය නම් ශක්තිමත් රාජ්‍ය බිහිවීම
- ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ව්‍යවස්ථාව බිහිවීම
- නූතන යුගයේ බිහි වූ ප්‍රථම ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ලෙස ඉතිහාසගත වීම **(ලකුණු 06)**

**05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

**(I) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය**

- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය නූතන පුරෝපා ශිෂ්ටාචාරය බිහි වීමට පදනම සැකසූ එක් බලවේගයක් වීම
- ක්‍රි.ව. තුන් වෙනි සියවස පමණ වන විට රෝම අධිරාජයාගේ සියලු ප්‍රදේශවල හා සුළු ආසියානු ප්‍රදේශ වලට කිතු දහම පැතිරී තිබීම
- කොන්ස්ටන්ටයින් අධිරාජයා කිතු දහම වැළඳගෙන ක්‍රි.ව. 313 දී මිලාන් ආඥාව මගින් කිතු දහම රෝම අධිරාජ්‍යය තුළ නීත්‍යානුකූල ආගමක් බවට පත් කිරීම
- තියඩෝසියස් අධිරාජයා හතරවෙනි සියවස අග භාගයේ දී සෙසු සියලු ආගම් මිථ්‍යා දෘෂ්ටික ආගම් ලෙස නම් කොට ඒවා ඇදහීම තහනම් කර ක්‍රිස්තු ධර්මය (රෝම අධිරාජ්‍යයේ රාජ්‍යාගම බවට පත් කිරීම) රෝම අධිරාජ්‍යය පුරා පැවතිය යුතු එක ම ආගම බවට පත්කිරීම -
- රෝම අධිරාජ්‍යයට එල්ල වූ ම්ලේච්ඡ ආක්‍රමණ වලින් පසු ගෝල් දේශය මුල් කොටගෙන තම රාජ්‍යය ගොඩනගාගත් ෆ්‍රැන්ක් ගෝත්‍රයේ ක්ලෝවිස් රජු කිතු දහම වැලඳ ගැනීම නිසා යුරෝපය තුළ කිතු දහම ව්‍යාප්ත වීම
- ඉන් පසු එම රාජ්‍යයේ සිහසුනට පත් චාලිමේන් අධිරාජයා එම රාජ්‍යය ශුද්ධ රෝම අධිරාජ්‍යය ලෙස නම් කොට එය ව්‍යාප්ත කිරීම, එමගින් ශුද්ධ රෝම අධිරාජ තනතුර බිහි වීම
- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ඇසුරෙන් යුරෝපා සමාජයට සංවිධානාත්මක ආගමක් ලැබීම
- ක්‍රි.ව. 590 දී පමණ මහා ග්‍රෙගරි පාප් වහන්සේ යටතේ පාප් තනතුර බිහි වීම හා එයට යුරෝපා සමාජයේ ආධිපත්‍යය හිමි වීම
- මිශනාරින් යවා බ්‍රිතාන්‍ය හා ජර්මන් ප්‍රදේශවල ද කිතු දහම ව්‍යාප්ත කරවීම
- ක්‍රිස්තු සභාව සමාජය මෙහෙයවන ප්‍රධාන බලවේගය බවට පත් වීම
- ම්ලේච්ඡ ආක්‍රමණ වලින් ජනතාව ආරක්ෂා කොට පැරණි සංස්කෘතිය ආරක්ෂා කිරීම ක්‍රිස්තු සභාව මඟින් සිදු කිරීම
- ක්‍රිස්තු සභාව අධ්‍යාපන කටයුතු මෙහෙය වන ප්‍රධාන ආයතනය වීම
- කලා නිර්මාණ කෙරෙහි නිරන්තරයෙන් කිතු දහමේ බලපෑම ඇති වූ අතර ආගමික අංශයට බර වූ නිර්මාණ බිහි වීම
- කිතු දහමේ බලපෑමත් සමඟ දේශපාලන ක්ෂේත්‍රයේ ද වෙනස්කම් ඇති වීම. ඒ අනුව දේවවරම් වාදී අදහස් ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීම **(ලකුණු 08)**

## (II) වැඩවසම් සමාජ ක්‍රමය

**දේශපාලන ලක්ෂණ**

- පාලන බලය බෙදී පැවතීම.
- රජවරු බලවත් නොවීම.
- බලය රජු හා රදලවරු අතර බෙදී ගොස් තිබීම.
- ප්‍රාදේශීය පාලකයන් බලවත් වීම.
- අධිකරණ බලය රදලවරු සතු වීම.
- විවිධ ප්‍රදේශ වලට විශේෂ වූ නිති ක්‍රම බිහි වීම.
- ප්‍රාදේශීය පාලකයන් අතර ගැටුම් පැවතීම.
- ප්‍රාදේශීය පාලකයන් හා රජු අතර ගැටුම් පැවතීම. (ද්වන්ද සටන්)
- රජුව ස්ථාවර යුද්ධ හමුදාවක් නොතිබීම.
- දේශපාලන අස්ථාවර බාවයක් පැවතීම.

**ආර්ථික ලක්ෂණ**

- වැඩවසම් අර්ථ ක්‍රමයකි.
- කෘෂිකාර්මික ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය.
- බණ්ඩාරගම.
- ප්‍රවේනි ක්‍රමය (ගොවියා හා ඉඩම අතර පැවති සම්බන්ධතාවය.)
- ඉඩම් භුක්තිය හා බැදුණු සේවා ක්‍රමය.
- ග්‍රාමීය ආර්ථිකය.
- ශ්‍රේණි ක්‍රමයක් ක්‍රියාත්මක වීම, නිර්මාණ පවා ශ්‍රේණියේ නමින් හැදින්වීම.
- රටේ භූමියේ හිමිකරු රජු යන සංකල්පය.
- වෙළදාම හා කර්මාන්ත සුලු වශයෙන් පැවතීම

**සමාජීය ලක්ෂණ**

- වැඩ වසම් සමාජ ක්‍රමය.
- සමාජයේ පන්ති කිහිපයකි.
- සාමාජ තරාතිරම උත්පත්තිය මත තීරණය වේ.
- උසස් යයි සම්මත සුළු පිරිසක් වරප්‍රසාද භුක්ති විදීම
- සාමුහික ජීවන රටාව.

**ආගමික හා සංස්කෘතික ලක්ෂණ**

- එක්සත් ක්‍රිස්තු සභාවක් පැවැත්වීම.
- අධික බලයක් පුජකවරුන් සතුවීම
- සංස්කෘතිය ක්‍රිස්තියානි ආගමට නැඹුරුවීම.
- පුළුල් අධ්‍යාපන දියුණුවක් නොතිබීම.
- අධ්‍යාපන කටයුතු පුජකවරුන් මෙහෙයවීම.

- වැඩවසම් ක්‍රමයේ පරිහානිය
- ආගමික හෙවත් කුරුස යුද්ධ
- දේශපාලන අස්ථාවර භාවය.
- නැවත රජු වටා බලය සංකේන්ද්‍ර ගත වීම නිසා ප්‍රාදේශීය පාලකයන් දුර්වලවීම,
- රජුවටා වැටුපට වැඩ කරන යුධ හමුදාවක් ගොඩනැගීම.
- ක්‍රි.ව 1453 කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අතට පත්වීම.
- විදේශ ආක්‍රමණ.
- ජාතික රාජ්‍ය බිහිවීම.
- මධ්‍යම පංතියේ වර්ධනය, (ආර්ථික, අධ්‍යාපනික හා දේශපාලනික වශයෙන්)
- ශාස්ත්‍රීය දියුණුව හා චින්තන විප්ලවය හෙවත් පුනරුදය.

- ඉඩම් භුක්තිය මත පදනම් වූ සේවා සම්බන්ධතා දුර්වල වීම.
- සමාජ තරාතිරම් තීරණය කිරීමේ දී උපත වෙනුවට ධනය වැදගත් වීම.
- රදළ පන්තියේ පිරිහීම
- නිදහස් නගර බිහිවීම.
- සාමූහිකත්වය වෙනුවට පුද්ගලිකත්ව හා තරගකාරිත්වය නැගී ඒම. **(ලකුණු 08)**

**(III) 1688 උත්කෘෂ්ට විප්ලවය**

- 1688 උත්කෘෂ්ට විප්ලවය හා 1689 අයිතිවාසිකම් පනත ස්ටුවට් රජවරුන් යටතේ රජු හා පාර්ලිමේන්තුව අතර බලය සඳහා වූ අරගලය විප්ලවයක් දක්වා ව්‍යාප්ත විය.
- ස්ටුවට් වංශික රජවරුන් තම බලය වර්ධනය කරගැනීමට උත්සාහ කිරීම් හා පාර්ලිමේන්තුව නොතකා හැරීම
- ස්ටුවට් වංශික රජවරුන් දේව වරම් වාදය පිළිගත් අතර උග්‍ර රෝමානු කතෝලිකයන් වීමත්, පාර්ලිමේන්තුවාදීන් රෙපරමාදු වාදීන් වීමත් දෙපක්ෂය අතර ගැටුම් වලට ප්‍රධාන හේතුව වූහ.
- තවද (ස්ටුවට් වංශික රජවරුන් දේව වරම්වාදය පිළිගත් අතර රාජ්‍ය බලයේ උල්පත මහජනයා බව (පාර්ලිමේන්තුව) විශ්වාස කළහ.
- 1 චාල්ස් රජු පාර්ලිමේන්තුව කැඳවීමෙන් තොරව රට පාලනය කිරීමට උත්සාහ කිරීම
- 1628 පාර්ලිමේන්තුව විසින් අයිතිවාසිකම් පිළිබඳ පෙත්සම 1 චාල්ස් රජු ලවා බලහත්කාරයෙන් අනුමත කරවා ගැනීම ගැටුමට මූලාරම්භය වේ.
- 1642 රජු සහ පාර්ලිමේන්තුව අතර සිවිල් යුද්ධයක් ඇති වීම.
- 1649 පළමු චාල්ස් රජුගේ හිස ගසා දැමීම.
- ක්‍රොම්වෙල්ගේ ප්‍රධානත්වයෙන් සමූහාණ්ඩුවක් පිහිටුවීම.
- 1658 දී දෙවන චාල්ස් බලයට පත් වී රාජ්‍යත්වය නැවත පිහිටු වීම හා ඔහු හිතුමතේට (අත්තනෝමතිකව) රට පාලනය කිරීමට උත්සාහ ගැනීම
- 1685 දී දෙවන ජේම්ස් බලයට පත් වීම හා ඔහුගේ හිතුවක්කාර පාලනය.
- 1688 උත්කෘෂ්ට විප්ලවය ආරම්භ වීම, දෙවන ජේම්ස් රජු පලා යාම නිසා ලේ බිඳකුදු නොසෙල්වා අලුත් රාජකීය යුවලක් බලයට පත් වීම.
- ඔරේන්ජ්හි විලියම් කුමරු සහ මේරි කුමරිය සිහසුනට පත් වීම.
- පාර්ලිමේන්තුව ජයග්‍රහණ කිරීම, රජුගේ බලය සීමා වීම.
- 1689 අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය සම්මත කිරීම.
- රජුට බදු අය කිරීමට හෝ හමුදාව තබා ගැනීමට පාර්ලිමේන්තුවේ අවසරය ලබාගත යුතු වීම.
- පාර්ලිමේන්තුව විසින් රජු සිහසුනට පත්කිරීම.
- එංගලන්තයේ සිහසුන රෙපරමාදු භක්තිකයෙකුට පමණක් උරුම විය යුතු බව තීරණය වීම. (රාජ්‍ය උරුමය තීරණය කිරීම පාර්ලිමේන්තුව සතු වීම)
- අයිතිවාසිකම් පිළිබඳ පනත මගින් මහජන නියෝජිත ආයතනය වූ පාර්ලිමේන්තුව රාජ්‍ය පාලන කටයුතු වල ප්‍රමුඛස්ථානයට පත් කිරීම.
- පාර්ලිමේන්තුව මහජන පරමාධිකාරි බලය මත පදනම් වූ නියෝජිත ආයතනයක් ලෙස ක්‍රමයෙන් වර්ධනය වීම.

**(ලකුණු 08)**

**(IV) ආගමික ප්‍රතිසංස්කරණ**

- ක්‍රිස්තියානි පල්ලියේ වංචා හා දූෂණ මැඩ පවත්වා නිසිලෙස ක්‍රිස්තියානි ධර්මය හා පල්ලිය ශක්තිමත් කිරීම මෙයින් අපේක්ෂා කිරීම
- පූජකවරුන්ගේ දූෂණ
- පාප් වහන්සේගේ බලයේ පදනම දෙදරා යාම
- ශාස්ත්‍රීය පුනරුදය හේතු කොටගෙන පල්ලියේ ඉගැන්වීම් විවේචනාත්මකව සලකා බැලීමට ජනතාව පෙළඹවීම.

- මාටින් ලූතර්ගේ නායකත්වය.
- යුරෝපයේ සෑම රටකම ඉඩම් වලින් විශාල කොටසක් පල්ලියට අයිති වී තිබීම.
- ඉඩම් වල ආදායමෙන් කොටසක් හා මිනිසුන්ගේ අයකළ බදුවලින් කොටසක් වශයෙන් යුරෝපා රටවල ආදායමෙන් විශාල ප්‍රමාණයක් රෝමයට ඇදියාම සහ නව රාජාණ්ඩුවල රජවරුන් එයට විරුද්ධ වීම.
- පාප්වහන්සේගේ දේශපාලන අධිකරණ හා ආර්ථික බලය
- පුණ්‍ය පල පත්‍ර විකිණීම.
- එක්සත් ක්‍රිස්තු සභාව බිඳී යාම
- විවිධ නිකායන් බිහිවීම.
- ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය බිහි වීම සහ එමගින් රෝමානු කතෝලික සභාවේ සංශෝධන සිදුවීම.
- විවිධ නිකායවල ආගමික මතවාද ප්‍රචාරය කිරීම සඳහා මිෂනාරි ව්‍යාපාර ආරම්භ වීම

**(ලකුණු 08)**

**C කොටස**

**06. (i) නැපෝලියන් බොනපාට් ප්‍රංශයේ පාලකයා බවට පත් වූ ආකාරය සැකෙවින් දක්වන්න.**

- 1769 දී කෝර්සිකා දූපතේ ඇජැසියෝ හි උපත ලද නැපෝලියන් පැරිසියට පැමිණ එහි අධ්‍යාපනය ලබා කාලතුවක්කු භටයෙකු වශයෙන් ප්‍රංශ යුධ හමුදාවට එක්වීම
- 1793 දී එංගලන්ත හමුදාවට පහර දී වූලෝං වරාය නිදහස් කොට ගැනීම. මෙය නැපෝලියන්ගේ නැගීමේ ආරම්භය විය.
- 1795 දී අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධව පැන නැඟුණු මහජන කැරැල්ල මර්දනය කිරීම
- 1796 දී ඉතාලියට විරුද්ධව මෙහෙයවන ලද හමුදාවේ නායකත්වය ගැනීම ඉතාලිය ආක්‍රමණය කිරීම, ඔස්ට්‍රියාව පරාජය කොට ඔස්ට්‍රියාව යටතේ තිබූ ඉතාලි රාජ්‍ය නිදහස් කොට ගැනීම
- ඔස්ට්‍රියාව සමඟ කැම්පෝෆෝමියෝ ගිවිසුම අත්සන් තැබීම, උතුරු ඉතාලිය යටත් කොට ගැනීම.
- මෝල්ටාව අල්ලා ගැනීම
- ඊජිප්තුව ආක්‍රමණය කිරීම
- 1799දී අධ්‍යක්ෂ මණ්ඩලය බලයෙන් පහකොට කොන්සල් ක්‍රමයක් ඇති කිරීම, තිදෙනෙකුගෙන් සමන්විත වූ කොන්සල් මණ්ඩලයේ එක් කොන්සල්වරයෙකු බවට නැපෝලියන් පත්වීම
- 1799 දී පළමු වැනි කොන්සල් බවට පත්වීම
- 1802 දී යාවජීව කොන්සල් බවට පත්වීම
- 1804 දී ප්‍රංශ අධිරාජයා ලෙස ඔටුනු පැළඳීම
- ජනමත විචාරණයකින් අධිරාජ තනතුර තහවුරු කොට ගැනීම **(ලකුණු 06)**

**(ii) නැපෝලියන්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය ඇසුරෙන් ඔහුගේ කාර්ය සංසිද්ධිය අගය කරන්න.**

**නැපෝලියන්ගේ දේශීය ප්‍රතිසංස්කරණ**

- ප්‍රංශයේ බොනපාට් වාදය තහවුරු කිරීම
- ප්‍රජාතන්ත්‍රවාදයට තරමක් දුරට ඉඩ ලැබීම
- ඒකාධිපති පාලකයෙකු වුවත් මැතිවරණ පැවැත් වීම
- දක්ෂතා අනුව තනතුරු වලට පත්වීමේ හැකියාව ලැබීම
- පරිපාලනමය ප්‍රතිසංස්කරණ ඇති කිරීම
- සංකේන්ද්‍රගත පාලන ක්‍රමයක් ඇති කිරීම
- ප්‍රදේශීය පාලන කටයුතු සඳහා ප්‍රිෆෙක්ට්වරුන් පත් කිරීම

- අධිරාජයා යටතේ විශ්වවිද්‍යාල පාලනය කිරීම
- ද්විතීයික අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා ලයිසීස් (Lycees) නම් අධ්‍යාපන ආයතන පිහිටුවීම
- අධිරාජ්‍ය පාලනය තහවුරු කරගැනීමට අධ්‍යාපනය ආයුධයක් කොට ගැනීම
- ස්වභාවික විද්‍යා හැදෑරීම ධෛර්යමත් කිරීම
- විද්‍යාව, ගණිතය යන විෂයය පාසල් වල ඉගැන්වීම අවධාරණය කිරීම
- 1801 දී පාප් තුමා සමඟ කොන්කෝඩාට් ගිවිසුම ඇති කොට ගැනීම රෝමානු කතෝලික ආගම රාජ්‍යාගම ලෙස පිළිගැනීම පල්ලිය සතු ඉඩම් මහජනයා අතර බෙදා දීමට කටයුතු කිරීම
- නැපෝලියානු නීති සංග්‍රහය නමින් පොදු නීති සංග්‍රහයක් ඇති කිරීම
- ප්‍රධාන කොන්සල්වරයා විසින් විනිශ්වයකාරවරුන් පත් කරනු ලැබීම
- රාජ්‍ය නිලධාරින් වෙනුවෙන් පරිපාලන උසාවි පිහිටු වීම
- "ලෙත්‍රෙ දී කැචේ " නම් වරෙන්තු ක්‍රමය නැවත ඇති කිරීම
- පෞද්ගලික නිදහස සීමා වීම
- පොත්පත්, පුවත්පත් නිදහස සීමා වීම
- ඒකීය මුදල් ක්‍රමයක් සහ බැංකු ක්‍රමයක් පිහිටුවීම
- ආනයන භාණ්ඩ සඳහා අධික තීරු ගාස්තු අය කිරීම
- ප්‍රංශයේ ගොවිතැන හා කර්මාන්ත දියුණු කිරීම, බීට් වගාව සහ සීනි නිශ්පාදනය වැනි කර්මාත ඇරඹීම
- ආහාර මිල පාලනය කිරීම
- 1800 දී ප්‍රංශ මහ බැංකුව පිහිටුවීම
- ගොවින්ට නිත්‍යානුකූලව ඉඩම් පවරා දීම
- කාර්යක්ෂම බදු ක්‍රමයක් ඇති කිරීම
- ප්‍රංශයේ කර්මාන්තවල දියුණුවක් ඇති වීම
- ලූවර් කෞතුකාගාරය ඉදි කිරීම
- මංමාවත් හා ඇළමාර්ග දියුණු කිරීම
- මහජන උද්‍යාන ඇති කිරීම
- ප්‍රංශ ජනතාව තුළ ජාතිමාමකත්වය වර්ධනය කිරීම

**නැපෝලියන්ගේ විදේශ ප්‍රතිපත්තිය**

- ඔස්ට්‍රියන් හමුදා පරාජය කොට ඔස්ට්‍රියාව සමඟ කැම්පෝෆෝමියෝ ගිවිසුම අත්සන් කිරීම
- 1801 දී ඔස්ට්‍රියාව සමඟ ලූනෙවිල් ගිවිසුම අත්සන් තැබීම, ඒ අනුව සිසැල්පයින්, ලිගුරියන්. හෙල්වැටික් හා බතාවියානු සමූහාණ්ඩුවලට ප්‍රංශ ආධිපත්‍යය පිළිගැනීමට සිදු වීම
- ප්‍රංශයට එරෙහි ව ඔස්ට්‍රියාව, රුසියාව හා එංගලන්තය එක්ව සන්ධානයක් ගොඩනැංවීම
- 1802 දී එංගලන්තය සමඟ ඒමියන්ස් ගිවිසුම අස්සන් තැබීම
- 1805 ට්‍රැෆල්ගාර් සටනේ දී ඉංග්‍රීසීන් අතින් නැපෝලියන් පරාජයට පත් වීම
- 1805 ඔස්ටලිට්ස් සටනින් ඔස්ට්‍රියානු හා රුසියානු ඒකාබද්ධ හමුදා පරාජයට පත් කිරීම ඔස්ට්‍රියාව සමඟ ප්‍රෙස්බර්ග් ගිවිසුම අස්සන් කිරීම
- ඔස්ට්‍රියානු ප්‍රදේශ රාශියක් එකතු කොට රයින් සංගමය පිහිටුවීම, මේ සමඟින් මෙතෙක් ශුද්ධ රෝම අධිරාජ්‍යය අවසාන වීම
- 1806 ජෙනා (ජීනා) සටනින් ප්‍රශියාව පරාජය කිරීම
- 1806 දී බර්ලින් හා මිලාන් ආඥා මඟින් මහාද්වීපික ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- 1807 ෆ්‍රීඩ්ලන්ඩ් සටනින් රුසියාව පරාජයට පත්කොට රුසියාව සමඟ ටිල්සිට් ගිවිසුම අත්සන් කිරීම
- ප්‍රෂියානු ප්‍රදේශ කීපයක් එකතු කොට වෙස්ට්ෆේලියා රාජ්‍යය පිහිටුවීම
- පෝලන්තයේ විශාල ප්‍රදේශයක් එක් කොට වෝර්සෝ ආදිපාද වසම පිහිටුවීම
- තමන් අල්ලාගත් ප්‍රදේශ වල සමූහාණ්ඩු පිහිටුවා ඒවායේ පාලන කටයුතු සඳහා තම ඥාතීන් පත් කිරීම

**(ලකුණු 10)**

07. **බාධක ජයගෙන ඉතාලිය එක්සත් කිරීමෙහි ලා මැසිනි, කැවුවර් හා ගැරිබෝල්ඩි යන නායකයන්ගේ කාර්ය භාරයන් පරීක්ෂා කරන්න.**

**ඉතාලිය එක්සත් කිරීමට පෙර ඉතාලියේ පැවැති තත්ත්වය**

- ඉතාලියේ පැවැති දේශපාලන බෙදීම්
  - නේපල්ස් සහ සිසිලි දූපත්, ස්පාඤ්ඤයේ බූර්බෝන් රාජවංශය යටතේ පාලනය වීම
  - රෝමය සහ මධ්‍යම ඉතාලිය පාප්තුමා යටතේ පාලනය වීම
  - පාර්මා, මොඩිනා සහ ටස්කනි, ඔස්ට්‍රියානු රජ පෙළපත් යටතේ පාලනය වීම
  - වෙනිස්, ලොම්බාඩි යන ප්‍රදේශ ඔස්ට්‍රියානු අධිරාජ්‍යය යටතේ පාලනය වීම
  - පීඩ්මොන්ට් හා සාර්ඩිනියා ඇතුළු ප්‍රදේශ ඉතාලි ජාතික සැවෝයි රජ පෙළපත යටතේ පැවතීම
- නැපෝලියන්ගේ පාලනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉතාලි ජනතාව තුළ එක්සත් භාවය පිළිබඳ හැඟීමක් ඇති වීම
- ජාතිකවාදී හැඟීම වර්ධනය

**ඉතාලිය එක්සත් කිරීමට දරන ලද ප්‍රයත්න හා ඊට සම්බන්ධ ව්‍යාපාර**

- ඉතාලියේ ජාතිකානුරාගය නැඟීම
- කාබොනාරි ව්‍යාපාරය
- කාබොනාරි සංගමයේ මෙහෙය වීමෙන් ඔස්ට්‍රියානු ආධිපත්‍යයට විරුද්ධව නිදහස් සටන් ව්‍යාපාර ආරම්භ වීම
- මැසිනිගේ තරුණ ඉතාලි ව්‍යාපාරය
- ජියෝබර්ටිගේ නායකත්වය යටතේ නව ගුවෙල්ෆ් ව්‍යාපාරය ආරම්භ වීම
- නව වැනි පියුස් පාප්තුමා ලිබරල්වාදී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීම
- 1848 ඉතාලි විමුක්ති සටන
- ප්‍රතිගාමිත්වය හිස එසවීම හා මේ ව්‍යාපාර අසාර්ථක වීම
- කවුන්ට් කැවූවර් පිඩ්මොන්ට් රාජ්‍යයේ අගමැති තනතුරට පත් වීම
- ඉතාලිය ආර්ථික අතින් සංවර්ධනය වීම
- ලිබරල්වාදීන්ගේ සහය ඇති ව ඉතාලියේ ප්‍රතිසංස්කරණ සිදු කිරීම
- ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නායකත්වය පීමොන්ට් රාජ්‍යයට හිමි වීම
- ක්‍රිමියානු යුද්ධයට සම්බන්ධ වීම
- ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයට ප්‍රංශයේ හා බ්‍රිතාන්‍යයේ සහය ලබා ගැනීම
- කවුන්ට් කැවූවර් හා ප්‍රංශයේ තුන්වැනි නැපෝලියන් ප්ලොම්බියර්ස් ගිවිසුම අස්සන් කිරීම
- ඉතාලි වැසියන් තුළ ජාතික හැඟීම් වර්ධනය කිරීම
- ගැරිබෝල්ඩිගේ රතු කමිස හමුදාව දකුණු ඉතාලියේ ප්‍රදේශ යටත්කොට පීඩ්මොන්ට් රජුට පැවරීම
- රෝමය හැර පාප් රාජ්‍යයේ සියලු ප්‍රදේශ යටත් කර ගැනීම
- 1866 වෙනීසිය ඈඳා ගැනීම
- 1870 රෝමය ඈඳා ගැනීමෙන් ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරය සම්පූර්ණ වීම

**(ලකුණු 16)**

08.“ **යුරෝපය බල කඳවුරුවලට බෙදී යාම පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමට මූල බීජය සපයන ලදී.**”

**(I) පලමුවන ලෝක සංග්‍රාම සමයේ සිටි ජර්මන් අධිරාජ්‍යයා නම් කරන්න.**

දෙවන විලියම් **(ලකුණු 01)**

**(II) පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමට බලපෑ ආසන්නත ම හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.**

සරයේවෝ සිද්ධිය - ක්‍රි.ව. 1914 ජූනි 28 දින ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි ප්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා හා ඔහුගේ බිරිඳ ඉසෙබෙලා කුමරිය සර්බියාවේ සරයේවෝ නගරයේ දී ඝාතනයට ලක් වීම **(ලකුණු 02)**

**(III) යුරෝපය සතුරු කඳවුරු දෙකකට බෙදී ගිය ආකාරය සැකෙවින් දක්වන්න.**

- ප්‍රංශය සතු ව පැවති ස්වාභාවික සම්පත් වලින් පොහොසත් ඇල්සාස් - ලොරේන් ප්‍රදේශ 1871 දී ජර්මනිය විසින් අල්ලා ගැනීම නිසා දෙරට අතර විරුද්ධත්වයක් හටගැනීම

- නව ජර්මන් අධිරාජ්‍යයේ ආරක්ෂාව සඳහා ප්‍රංශය හුදෙකලා කොට තැබීම අරමුණු කර ගෙන බිස්මාක් විසින් යුරෝපයේ මිත්‍ර සන්ධාන ක්‍රමය ආරම්භ කරනු ලැබීම
- බිස්මාගෙන් පසු ජර්මන් විදේශ ප්‍රතිපත්තිය වෙනස් වී යාම
- යුරෝපයේ රටවල් එකිනෙකට විරුද්ධ බල කඳවුරු දෙකකට බෙදී යාම
- ප්‍රංශ - එංගලන්ත මිත්‍රත්වය හා ප්‍රංශ - රුසියානු මිත්‍රත්වය ජර්මනියට විරුද්ධව 1907 දී ඒකාබද්ධ වීම
- 1908 වන විට ජර්මනිය, ඔස්ට්‍රියාව හා ඉතාලිය සන්ධාන ගත වීම ( අවසාන මොහොතේ ඉතාලිය ජර්මනියෙන් ඉවත් වී එංගලන්තය දෙසට හැරිණි.)
- බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව, ඉතාලිය සහ අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර පිල නමින් හා ජර්මනිය, ඔස්ට්‍රියාව, හංගේරියාව, තුර්කිය හා බල්ගේරියාව මධ්‍යම බලවතුන්ගේ පිල නමින් හැඳින්වීම

**(ලකුණු 04)**

(V) **පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමට තුඩු දුන් සාධක පරීක්ෂා කරන්න.**

**නව අධිරාජ්‍යවාදය**

- ජර්මනිය, ඉතාලිය යන රටවල් යුරෝපයේ නව බලවතුන් ලෙස නැඟී සිටීම
- කාර්මීකරණය නිසා ප්‍රධාන යුරෝපා රටවල ආර්ථික වර්ධනයක් ඇති වීම
- පුළුල් වූ නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම, මහා පරිමාණ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සහ අතිරික්ත මූල ධනය ආයෝජනය කිරීම සඳහා වෙළෙඳ පොළවල් ලබා ගැනීම නව අධිරාජ්‍යවාදයේ අරමුණ වීම
- ප්‍රංශය, බ්‍රිතාන්‍ය, පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ඉතාලිය බෙල්ජියම, ජර්මනිය ආදී රටවල් යටත් විජිත තරගයක නිරත වීම

**අප්‍රිකාව සඳහා වූ තරගය**

- 19 වන සියවස අග භාගය වන විට යුරෝපා ජාතීන් අප්‍රිකාව කෙරෙහි අවධානය යොමු කිරීම
- අප්‍රිකාව සතු වටිනා ඛනිජ සම්පත් සූරාකෑම යුරෝපීයයන්ගේ අරමුණ වීම
- බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඕලන්දය, ස්පාඤ්ඤය, පෘතුගාලය, ඉතාලිය, බෙල්ජියම ආදි රටවල් අප්‍රිකා මහාද්වීපය බෙදා ගැනීම

**බෝල්කන් ප්‍රශ්නය**

- 19 වන සියවස අවසන් වන විට පරිහානියට පත්වෙමින් පැවති තුර්කි අධිරාජ්‍යයේ යටත් වැසියන් වූ ක්‍රිස්තු භක්තිකයන් තුර්කි අධිරාජ්‍යයට විරුද්ධව නැඟී සිටීම
- රුසියාව තුර්කි අධිරාජ්‍යය බිඳ දමා එම ප්‍රදේශවල නව ආධිපත්‍යය පැතිරවීමට අපේක්ෂා කිරීම
- බ්‍රිතාන්‍යය, ප්‍රංශය වැනි යුරෝපා රටවල් ඊට විරුද්ධව තුර්කි අධිරාජ්‍යය තව දුරටත් ආරක්ෂා කොට ගැනීමට කටයුතු කිරීම
- තුර්කි අධිරාජ්‍යය සතුව පැවති බොස්නියා - හර්සිගොවිනා ප්‍රදේශ ඔස්ට්‍රියාව විසින් ඈඳා ගැනීම
- පළමු වැනි ලෝක යුද්ධයට ආසන්නතම හේතුව බෝල්කන් අර්බුදය මඟින් හටගැනීම - සරයේවෝ සිද්ධිය **(ලකුණු 09)**
-

**(09) පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩු දුන් සාධක**

**දේශපාලන හේතු**

- රටේ සියලු බලතල රජු වෙත සංකේන්ද්‍රගත වී තිබීම
- පාලකයන් අකාර්යක්ෂම වීම

  උදාහරණ: පහළොස් වැනි ලුවී හා දාසය වැනි ලුවී රජවරු

- අනවශ්‍ය යුද්ධ වලට සහභාගී වීම

  උදාහරණ: දහහතර වෙනි ලුවී රජු ස්පාඤ්ඤ රාජ්‍ය ප්‍රාප්ති යුද්ධයට සම්බන්ධ වීම

- එංගලන්තයට විරුද්ධව ගෙන ගිය යුද්ධ
- පහළොස් වෙනි ලුවී රජු හත් අවුරුදු යුද්ධයට හා අමරිකානු නිදහස් සටනට සහභාගී වීම
- දාසයවෙනි ලුවී රජුගේ අදූරදර්ශී ක්‍රියාකලාපය

  උදාහරණ - ටර්ගෝ, නෙකර් වැනි දක්ෂ ඇමතිවරුන් ඉවත් කොට රදලයන්ගේ ඉල්ලීම පරිදි
  අදක්ෂ ඇමතිවරුන් පත් කිරීම
  මාරි ඇන්ටොයිනට් බිසවගේ උපදෙස් අනුව කටයුතු කිරීම
- රාජාණ්ඩුව දුර්වල වීම

**ආර්ථික හේතු**

- සාමාන්‍ය ජනතාව මත ඔරොත්තු නොදෙන තරම් බදු පනවා තිබීම
- මධ්‍යම පන්තියේ දියුණුවට පැවති බාධක
- රදලයන් බදු කිසිවක් නොගෙවා අධික වරප්‍රසාද භුක්ති විඳිමින් සිටීම
- බදු ප්‍රතිපත්තියේ අක්‍රමිකතා
- ඉඩම් කොටු කිරීම නිසා ඇති වූ ප්‍රතිඵල
- අධික යුද වියදම් නිසා රාජ්‍ය භාණ්ඩාගාර බංකොලොත් වීම
- රජ පවුලේ සුඛෝපභෝගී ජීවිත නඩත්තුව සඳහා රටේ ආදායමෙන් විශාල ප්‍රමාණයක් වැය වීම
- ඊඩ්න් වෙළෙඳ ගිවිසුම හා එහි ප්‍රතිඵල

**සමාජීයිය හේතු**

- සාමාන්‍ය ජනතාව මුහුණ පෑ දුෂ්කරතා
- උත්පත්තිය මත සමාජ තරාතිරම තීරණය කිරීම හා පන්ති විෂමතා
- ප්‍රභූ පන්තියට පමණක් සියලු වරප්‍රසාද හිමි වීම

**බාහිර හේතු**

- දාර්ශනිකයන්ගේ බලපෑම

  (හොබ්ස්, ලොක්, රූසෝ, වෝල්ටෙයර්, මොන්ටෙස්ක්‍යු වැනි අය )

- හත් අවුරුදු යුද්ධය හා අමෙරිකානු නිදහස් සටන
- ප්‍රංශයට බලපෑ දේශගුණ තත්ත්වය (අධික ශීත ඍතුව, දුර්භික්ෂ, නියඟ) **(ලකුණු 08)**

**(ii) දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල**

- ලෝකයේ මෙතෙක් පැවති බිහිසුණු ම සංග්‍රාමය වූ නිසා ලෝකය පුරා මානව සම්පත් හා භෞතික සම්පත් දැවැන්ත ලෙස විනාශ වීම
- භෞතික පරමාණු බෝම්බවලින් හිරෝෂිමා හා නාගසාකි විනාශ වී ගිය අතර එහි ප්‍රතිඵල අනාගත පරම්පරාව අතර ද දැකිය හැකි වීම
- ජර්මනිය විනාශයට පත් වීම
- ජර්මනිය, නැඟෙනහිර ජර්මනිය හා බටහිර ජර්මනිය යනුවෙන් දෙකඩ වීම
- මෙතෙක් ලෝක බලවතුන් ලෙස සිටි එංගලන්තයට හා ප්‍රංශයට එම ස්ථානය අහිමි වීම.
- බ්‍රිතාන්‍ය - ප්‍රංශ අධිරාජ්‍ය බිඳවැටීම
- අමෙරිකා එක්සත් ජනපදය සහ සෝවියට රුසියාව සුපිරි බලවතුන් ලෙස නැගී සිටීම
- අමෙරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයා ලෙස ඉදිරිපත් වීම
- බ්‍රිතාන්‍යය, ප්‍රංශය, බෙල්ජියම, ඕලන්දය, බටහිර ජර්මනිය ආදි ධනවාදී අර්ථ ක්‍රම සහිත රටවල් අමෙරිකා එක්සත් ජනපදය සමඟ එක් කඳවුරකට එකතු වීම
- සෝවියට් රුසියාව මුල් කොටගෙන කොමියුනිස්ට් බල කඳවුරක් බිහි වීම.
- පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, බල්ගේරියාව, යුගොස්ලාවියාව, නැගෙනහිර ජර්මනිය ආදී රටවල් එකී කොමියුනිස්ට් කඳවුරට අයත් වීම
- පරාජිත රටවල් ( විශේෂයෙන් බටහිර ජර්මනිය හා ජපානය) නඟා සිටුවීම සඳහා එක්සත් ජනපදය විසින් මාර්ෂල් සැලැස්ම හඳුන්වා දීම
- බ්‍රිතාන්‍යය හා ප්‍රංශය සතු ව පැවති යටත් විජිතවලට නිදහස ලැබීම

- ලෝක සාමය ආරක්ෂා කිරීම සහ ජාතීන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම **(ලකුණු 08)**

**(iii) වී.අයි. ලෙනින්**

- 1870 දී උපත ලැබූ මොහු උසස් අධ්‍යාපනය ලබන අවදියේදීම මාක්ස්වාදය, රුසියාවේ සමාජ, ආර්ථික, පරිසරය හා සමාජවාදී ව්‍යාපාරය ආදිය පිළිබඳ අවධානය යොමු කිරීම
- සාර් විරෝධී දේශපාලන කටයුතු වල නිරත වීම හේතුවෙන් ඝාතනය කරන ලද තම වැඩිමහල් සොහොයුරාගේ ආභාෂය ලැබීම
- 1896 පීටර්ස්බර්ග් හි කපු කර්මාන්තකරුවන්ගේ වර්ජනයට නායකත්වය දීම
- 1898 දී රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය පිහිටුවා ගැනීමට මූලික විම
- 1917 ඔක්තෝම්බර් විප්ලවයෙන් රුසියාවේ පාලකයා බවට පත් වීම **(ලකුණු 08)**

(iv) **තුෂ්ණී යුද්ධය**

- දෙවන ලෝක යුද්ධය අවසන් වීමත් සමඟ මහජාතීන් අතර පැවති මිත්‍රත්වය බිඳ වැටී ඔවුන් වටා රොක් වූ බලකඳවුරු දෙකක් බිහි විය.
  1. ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රධාන ධනවාදී, ප්‍රජාතන්ත්‍රවාදී රටවල්
  2. සෝවියට් රුසියාව ප්‍රධාන සමාජවාදී කොමියුනිස්ට් රටවල්
- කඳවුරු අතර අවිශ්වාසය වර්ධනය වීම.
  -සෝවියට් ආණ්ඩුව විසින් අත්පත් කරගත් ප්‍රදේශ වල කොමියුනිස්ට් ආණ්ඩු පිහිටු වීම.
  -අමෙරිකාව සතුව පරමාණු බෝම්බයක් තිබීම.
  -කඳවුරු දෙක අතර දේශපාලන මතවාදීමය වශයෙන් ප්‍රතිවිරෝධතා පැවතීම.
- 1947 මාර්තු ප්‍රකාශයට පත් කෙරුණු ටෘමන් න්‍යාය - නිදහස් රටවල ආරක්ෂාවටත්, ඒවාට එරෙහි බලවේග වලට විරුද්ධවත් අමෙරිකා එක්සත් ජනපදය ආධාර කරන බවට දුන් පොරොන්දුව, ඒ අනුව ග්‍රීසියේ කොමියුනිස්ට්වාදය නැඟී සිටීම මර්දනය කිරීමට මැදිහත් වීම.
- මාෂල් සැලැස්ම මගින් යුරෝපය යළි ගොඩනැංවීමට ආධාර කිරීම මගින් කොමියුනිස්ට් ව්‍යාප්තිය සීමා කිරීමට උත්සහ ගැනීම.
  -1949 දී නේටෝ (NATO) සංවිධානය පිහිටු වීම.
  -ඊට ප්‍රතිචාර වශයෙන් සෝවියට් කඳවුර 1955 දී වොර්සෝ කඳවුර පිහිටු වීම.
- ඍජුවම යුද්ධයකට සහභාගී නොවී එකිනෙක කඳවුරු අතර සිදු වූ අරගලයක් වීම. **(ලකුණු 08)**